**හබරාදූව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.1,255,685 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.6,083,566 ක දායක මුදල ණයහිමියන් යටතේ ගිණුම් ගතකර නොතිබීමෙන් ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) භාවිතයෙන් ඉවත් කරන ලද රු.364,410 ක විදුලි උපකරණ තොගයක් ඇතුළත් වීම නිසා වර්ෂ අවසාන තොග ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.45,131,053 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂ අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.42,518,088 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

--------------------

2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.601,430 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන අදාළ ගැලපීම් කර, ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,383,940 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.2,901,253 ක් වූ ගෙවිය යුතු ශේෂ 05 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.91,225,382 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය හා විධිමත් උපලේඛන ද, රු.767,252 ක් වූ විදුලි තොගය සඳහා විදුලි භාණ්ඩ ලේඛනය ද, රු.148,965 ක් වූ විවිධ ණයගැති හා රු.8,923,043 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛන ද, එකතුව රු.13,616,895 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් සඳහා තැන්පත් ලේඛනය ද, රු.304,869 ක් වූ දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ශේෂය සඳහා ශේෂ තහවුරු කිරීම් ලිපි ද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු එකතුව රු.1,826,957 ක් වූ තැන්පතු ශේෂ 110 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ පුනරාවර්තන ආදායම රු.5,913,387 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ පුනරාවර්තන ආදායම රු.13,690,543 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.19,603,930 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම් බදු

වර්ෂයේ බිල් කිරීම් සමඟ ඉකුත් වර්ෂ වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු එකතුව රු.13,140,698 ක් වූ වරිපනම් බදු වලින් වර්ෂය තුළ අය කරගෙන තිබුණේ සියයට 47 ක අගයක් පමණි.

#### 2.2.2 අක්කර බදු

වර්ෂයේ බිල් කිරීම් සමග ඉකුත් වර්ෂ වෙනුවෙන් අයකර ගත යුතුව තිබුණු රු.11,020 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.540 ක් තරම් අවම අගයක් පමණි. ඉහත අංක 2.2.1 හා 2.2.2 ඡේදවල දැක්වෙන හිඟ වරිපනම් බදු හා අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,396,887 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.3,127,999 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) (i) සභාවේ සේවයේ නියුතු සේවකයින් 19 දෙනෙකු විසින් ලබාගෙන තිබුණු වැටුප් රහිත නිවාඩු දින 606 ක් වෙනුවෙන් අයවිය යුතු වූ රු.636,907 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) වාර්ෂික ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම නිසා සභාවේ සේවය කරන සමහර නිලධාරීන් හා සේවකයින් ඇතුළු 11 දෙනෙකු අඛණ්ඩව වසර 10 කට වඩා වැඩි කාලයක් තිස්සේ සේවය කරමින් තිබුණි.

(ආ) 2016 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පුස්තකාල දෙකක නැති වූ පොත් 21 ක් සහ පාඨකයින් විසින් බැහැර ගෙනගොස් භාර නොදුන් පොත් 59 ක් ඇති බව අනාවරණය වී තිබුණි. නමුත් මෙම පොත්වල වටිනාකම තීරණය කර, සභාවට සිදු වූ අලාභයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 07 දින කොම්පෝස්ට් ව්‍යාපෘතිය නතරවීම හේතුවෙන්, එම ව්‍යාපෘතියේ භාවිතයට ගන්නා ලද රු.245,000 ක් වූ හලර් යන්ත්‍රයක් හා පිළිසරු ව්‍යාපෘතියෙන් ලද වටිනාකම ගණනය නොකළ තවත් ක්‍රෂර් යන්ත්‍රයක් හා හලර් යන්ත්‍රයක් භාවිතයෙන් ඉවත් කර තිබුණි.

(ආ) 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර කටයුතු නොකර දීර්ඝ කාලයක සිට ප්‍රයෝජනයට යොදා නොගන්නා වාහන 07 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් පරිහරණය කරනු ලබන විවිධ ආයතනවලට අයත් පිරිවැය එකතුව රු.34,872,063 ක් වූ වාහන 06 ක අයිතිය පවරා ගැනීමට 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.23,952,335 ක් වූ ඉතිරිවීම් ද, ආදායම් විෂයයන් 07 ක එකතුව රු.72,552,097 ක් වූ ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ච.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධතිය | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ඉකුත් වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන බදු ශේෂ, අත්තිකාරම් ගිණුමේ ශේෂය අවිනිශ්චිත ගිණුමේ ශේෂය, ණය හිමි ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) බැංකු ගිණුම් අතර පවතින ශේෂයන් නිරවුල් කර නොතිබුණි. |
| | (iii) හිඟ ආදායම් ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) වාහන පාලනය | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |